ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2024.08.16 |

**පැමිණිලිකාර පාර්ශවය** : 01. ආදිවාසී නායක වන්නිල ඇත්තෝ,

කොට බකිනිය, දඹාන, මහියංගණය

**වින්දිත පාර්ශවය** : තලා වරිගේ පුංචි බණ්ඩා

**වගඋත්තරකාර පාර්ශවය** : 01. එච්.ජී.සමන් ප්‍රියදර්ශන - සහකාර බන්ධනාගාර අධිකාරි,

බන්ධනාගාර දෙපාර්තමේන්තුව- මොණරාගල .

02. විතානගේ ප්‍රේමසිරි -බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර්,

බන්ධනාගාර දෙපාර්තමේන්තුව- මොණරාගල .

**පැමිණිලි අංකය :- HRC/HO/786/24**

**පැමිණිල්ලේ කරුණු දැක්වීම:**

උක්ත පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 2024.02.22 දිනැතිව පැමිණිල්ලක් ගොනු කරමින් ප්‍රකාශ කර සිටින්නේ තම ප්‍රජාවට අයත් සාමාජිකයකු වන මෙම පැමිණිල්ලට අදාළ වින්දිත පාර්ශවය වන තලාවරිගේ පුංචි බණ්ඩා යන අය අම්පාර මහාධිකරණයේ විභාග වූ නඩු අංක HC/AMP/CR/2181/21 යටතේ ස්ත්‍රී දූෂණ වරදකට වැරදිකරු වී දඬුවම් ලැබීම හේතුවෙන් 2024.02.14 වන දින මොණරාගල බන්ධනාගාරයට ඇතුළත් කිරීමෙන් පසු 2024.02.15 වන දින වින්දිත පාර්ශවය වන තලාවරිගේ පුංචි බණ්ඩාගේ දිගු රැවුල සහ කොණ්ඩය බලහත්කාරයෙන් කපා මුඩු කර ඇති බවයි. ඒ හේතුවෙන් වින්දිත පාර්ශවය වන තලාවරිගේ පුංචි බණ්ඩා හට තම ප්‍රජාවට මුහුණ දීමට නොහැකි තත්ත්වයක් උද්ගතව ඇති බවත්, එලෙස දිගු රැවුල සහ කොණ්ඩය කපා මුඩු කිරීම තුළින් ආදිවාසී ප්‍රජාවගේ අභිමානය සහ අනන්‍යතාවය පළුදු වීමක් සිදුව ඇති බවත් පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත.

එසේම, 2024.06.06 වන දින කොමිෂන් සභාව හමුවේ පැවැත්වූ පරීක්ෂණයෙන් පසු පැමිණිලිකාර පාර්ශවය වන ආදිවාසි නායක වන්නිල ඇත්තෝ විසින් 2024.06.13 දිනැතිව ලිඛිත ඉල්ලීමක්




| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.<br>14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.<br>14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති<br>தவிசாளர்<br>Chairperson | 011-2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2505541 / 74 | ඊමේල්<br>மின்னஞ்சல்<br>E-mail | sechrc@gmail.com |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94-11-2505580 / 81 / 82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2505521 | ක්ෂනික<br>துரித அழைப்பு<br>Hotline | 1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

සිදුකරමින් ප්‍රකාශ කර ඇත්තේ වින්දිත පාර්ශවය වන තලාවරිගේ පුංචි බණ්ඩාගේ දිගු රැවුල සහ කොණ්ඩය බලහත්කාරයෙන් කපා මුඩු කිරීම සම්බන්ධයෙන් බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් ඔහුගෙන් ප්‍රසිද්ධ මාධ්‍යයක් ඔස්සේ (පුවත්පත් දැන්වීමක් වැනි) සමාව ඉල්ලා සිටිය යුතු බවයි. එසේම, මෙවැනි අගතීන් ඉදිරියට සිදු නොවීමට ආදිවාසි අයිතිවාසිකම් පිළිබඳව එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනය සහ අධිකරණ අමාත්‍යාංශය විසින් කෙටුම්පත් කර ඇති ආදිවාසි පනත් කෙටුම්පත අනුව ආදිවාසි ප්‍රජාවේ කවුරුන් හෝ කිසියම් හෝ වරදකට බන්ධනාගාර ගත වුවහොත් ඔහු හෝ ඇය සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳව නීති මාලාවන් සකස් කර බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නීති මාලාවට එකතු කිරීමට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් ඉල්ලා සිට ඇත.

<u>වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම:</u>

1 වන වගඋත්තරකාර පාර්ශවය වන මොණරාගල බන්ධනාගාරයේ සහකාර බන්ධනාගාර අධිකාරි විසින් අංක මොණ/ලි.වි/බන්ධ/මානව හිමිකම්/2024 සහ 2024.03.06 දිනැති වාර්තාව මගින් පැමිණිල්ලට අදාළව කරුණු දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ මෙම පැමිණිල්ලට අදාළ වින්දිත පාර්ශවය වන තලාවරිගේ පුංචි බණ්ඩා යන අය බාලවයස්කාර දැරියක් දූෂණය කිරීමේ චෝදනාව මත අම්පාර ගරු මහාධිකරණයේ විභාග වූ අංක HC/AMP/CR/2181/21 දරණ නඩුව යටතේ අවුරුදු දොළහකට සහ ඊට අදාළ වන්දි හා දඩ නොගෙවීම මත තවත් අවුරුදු හතරකට සිර දඬුවම් නියම කිරීමෙන් පසු 2024.02.14 දින මොණරාගල බන්ධනාගාරයට ඇතුළත් කර ඇති බවයි. එසේම, මේ වන විට එකී වින්දිත පාර්ශවය වන තලාවරිගේ පුංචි බණ්ඩා යන අය නැවත වැලිකඩ බන්ධනාගාරය වෙතට මාරුකර එවා ඇති බව ද ප්‍රකාශ කර ඇත.

එකී වාර්තාව තුළින් වැඩිදුරටත් දක්වා ඇත්තේ 2024.02.15 වන දින උදැසන සිර ලියාපදිංචි කිරීමේ අංශයේදී වින්දිත පාර්ශවය වන තලාවරිගේ පුංචි බණ්ඩා යන අය ඇතුළුව සිරකරුවන් දෙදෙනකු ලියාපදිංචි කිරීමෙන් පසුව එම සිරකරුවන් දෙදෙනා බන්ධනාගාර වෛද්‍යවරයා වෙත යොමු කර විශේෂ වෛද්‍ය නිර්දේශ නොමැති බැවින් බන්ධනාගාර නිත්‍ය නියෝග 495 වගන්තිය හා බන්ධනාගාර ආඥා පනතේ 160 වන වගන්තිය ප්‍රකාරව සිවිල් සිරකරුවන් හෝ වරදකරු නොවූ සිරකරුවන් නොවුණු හෙයින් බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අනුබද්ධ සියලුම බන්ධනාගාර ආයතනවල වරදකරු වූ සිරකරුවන් සම්බන්ධයෙන් දැනට පවත්වාගෙන යනු ලබන ක්‍රමවේදයට අනුව ආයතනයේ රඳවා සිටින රැඳවියන්ගේ පිරිසිදුභාවය හා සනීපාරක්ෂාව යන කරුණු අනුව සුපුරුදු අයුරින්ම සියලු සිරකරුවන්ගේ කොණ්ඩය හා රැවුල කොටට කපන අයුරින්ම වින්දිත පාර්ශවය වන තලාවරිගේ පුංචි බණ්ඩා යන අයගේ ද කොණ්ඩය හා රැවුල කැපීමට කටයුතු කර ඇති බවයි.

එසේම, 1 වන වගඋත්තරකාර පාර්ශවය වන සහකාර බන්ධනාගාර අධිකාරී විසින් තවදුරටත් කරුණු දක්වමින් ප්‍රකාශ කර සිටින්නේ වින්දිත පාර්ශවය වන තලාවරිගේ පුංචි බණ්ඩා යන සිරකරු හෝ ඔහුගේ නීත්‍යානුකූල ඥාතියකු හෝ නීත්‍යානුකූල යම් අයෙකු මෙම සිරකරුගේ කොණ්ඩය හා රැවුල කැපීම සිදු නොකරන ලෙසට යම් ඉල්ලීමක් සිදු කර තිබුණේ නම් ඒ ඉල්ලීම බන්ධනාගාර

කොමසාරිස්වරයා වෙත යොමුකර අවශ්‍ය උපදෙස් ලබාගෙන මෙම ආයතනය මගින් එම ඉල්ලීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවකාශ තිබුණ බවයි.

**නිරීක්ෂණ**

පැමිණිලිකාර පාර්ශවය වන ආදිවාසී නායක වන්නිල ඇත්තෝ ප්‍රකාශ කර සිටින්නේ වින්දිත පාර්ශවය වන තලාවරිගේ පුංචි බණ්ඩා යන සිරකරුවාගේ කොණ්ඩය හා රැවුල කැපීම සිදුවන අවස්ථාවේ බන්ධනාගාර නිලධාරීන් එහි බලවත් බැවින් හා ඔවුන්ගේ ක්‍රියා සම්බන්ධයෙන් විරුද්ධ වීමට මෙම සිරකරුට හැකියාවක් නොමැති බැවින් ඒ මොහොතේ සිරකරු විසින් හඬා වැටී ඇති බවත්, එමගින් ඔහුගේ කොණ්ඩය හා රැවුල කැපීමට ඇති විරුද්ධත්වය හැඟවෙන බවත් ය.

1 වන වගඋත්තරකාර පාර්ශවය වන මොණරාගල බන්ධනාගාරයේ සහකාර බන්ධනාගාර අධිකාරි විසින් වින්දිත පාර්ශවය වන තලාවරිගේ පුංචි බණ්ඩා යන අයගේ කොණ්ඩය හා රැවුල කැපීමේදී ඔහු ඒ සඳහා විරුද්ධත්වයක් ප්‍රකාශ කර නොතිබූ බවත්, කිසිදු අයෙකුගේ කොණ්ඩය හා රැවුල බලහත්කාරයෙන් නොකපන බවත් ප්‍රකාශ කර ඇත. එසේම, වැඩිදුරටත් කරුණු දක්වමින් 1 වන වගඋත්තරකාර පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇත්තේ වින්දිත පාර්ශවය වන තලාවරිගේ පුංචි බණ්ඩා යන අයගේ කොණ්ඩය හා රැවුල කැපූ කරනවෑමියාගෙන් ද ප්‍රකාශයක් ලබා ගෙන ඇති බවත්, එම ප්‍රකාශයට අනුව ද වින්දිත පාර්ශවය වන තලාවරිගේ පුංචි බණ්ඩා යන අය විසින් තම කොණ්ඩය හා රැවුල කැපීම සම්බන්ධව විරුද්ධත්වයක් ප්‍රකාශ කර නොමැති බව අනාවරණය වන බවත් ය.

වින්දිත පාර්ශවය වන තලාවරිගේ පුංචි බණ්ඩා යන අයගේ කොණ්ඩය හා රැවුල කැපූ කරනවෑමියා වන සුරංග රත්නායක (21983) යන අය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 2024.04.09 වන දින ප්‍රකාශ කර ඇත්තේ ද කොණ්ඩය හා රැවුල කැපීමට පැමිණි අවස්ථාවේදී වින්දිත පාර්ශවය ඒ සඳහා අකමැත්තක් නොපෙන්වූ බවත්, කොණ්ඩය හා රැවුල කැපීමෙන් අනතුරුව ද වින්දිත පාර්ශවය ඒ සම්බන්ධයෙන් කිසිදු ආකාරයක දුක්මුසු ස්වභාවයකින් සිටින බවක් තමා නොදුටු බවත් ය.

කෙසේවුවද, වින්දිත පාර්ශවය වන තලාවරිගේ පුංචි බණ්ඩා යන අය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 2024.03.26 වන දින ප්‍රකාශ කර ඇත්තේ තමාගේ කොණ්ඩය හා රැවුල කැපීම සම්බන්ධයෙන් කිසිදු කැමැත්තක් නොතිබුණ නමුත්, බන්ධනාගාරය තුළ දී තමා හට ගැටලු ඇතිවේය යන හැඟීම මත කොණ්ඩය හා රැවුල කැපීමට කිසිදු ආකාරයකින් විරුද්ධ වීමක් සිදු නොකළ බවයි. ඒ අනුව කොණ්ඩය හා රැවුල කැපීම සිදු කරන අවස්ථාවේදී වින්දිත පාර්ශවය විසින් ඒ සඳහා විරෝධතාවයක් දක්වා නොතිබුණ ද ඔහු ඊට අකමැත්තෙන් සිට ඇති බවට පැමිණිලිකාර පාර්ශවය විසින් සිදු කර ඇති ප්‍රකාශය අනුව පෙනී යයි.

1 වන වගඋත්තරකාර පාර්ශවය වන මොණරාගල බන්ධනාගාරයේ සහකාර බන්ධනාගාර අධිකාරි විසින් කරුණු ඉදිරිපත් කර ඇත්තේ වින්දිත පාර්ශවය වන තලාවරිගේ පුංචි බණ්ඩා යන අය ආදිවාසී

ප්‍රජාවට අයත් බව හඳුනාගත නොහැකි වූ බවත්, ඔහු විසින් ඒ බව කිසිදු අවස්ථාවක ප්‍රකාශ කර නොමැති බවත්ය. එසේම, 2 වන වගඋත්තරකාර පාර්ශවය වන මොණරාගල බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර්වරයා විසින් ද ප්‍රකාශ කර ඇත්තේ වින්දිත පාර්ශවය ආදිවාසී පරම්පරාවට අයත් වන බව දැන නොසිටි බවත්, ඔහු ඒ බව කිසිවිටෙක ප්‍රකාශ කර නොමැති බවත්ය.

පැමිණිලිකාර පාර්ශවය විසින් දක්වා ඇත්තේ වගඋත්තරකාර පාර්ශවය කියා සිටින පරිදි මෙම වින්දිත පාර්ශවය වන තලාවරිගේ පුංචි බණ්ඩා යන අයගේ අනන්‍යතාවය හඳුනා ගැනීමට නොහැකි වූ බව පිළිනොගන්නා බවයි. පුද්ගලයෙකු සිරගත කිරීමේදී ඔහු සම්බන්ධව සියලු විස්තර බන්ධනාගාරය විසින් ලබා ගන්නා බැවින් හා විශේෂයෙන්ම මේ පුද්ගලයාගේ නමෙහි ඇති සුවිශේෂීත්වය සහ බාහිර ස්වරූපයේ වෙනස්කම් මත මොහු වැදි පරම්පරාවට අයත් පුද්ගලයෙකු බව පැහැදිලිවම හඳුනාගත හැකි බව පැමිණිලිකාර පාර්ශවය ප්‍රකාශ කර සිටියි.

පැමිණිලිකාර පාර්ශවය විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ ආදිවාසී පරම්පරාවට හෝ ගෝත්‍රයට අයත් පුද්ගලයකු හඳුනා ගැනීම සඳහා ඔහුගේ බාහිර ශරීර අංග ලක්ෂණ උපකාරී වන බවත්, ඒ අතරින් එම පුද්ගලයාගේ කොණ්ඩය හා රැවුල අතිශය වැදගත් අංග ලක්ෂණ වන බවත් ය. එසේම, ප්‍රධාන වශයෙන් වැදි පරම්පරාවේ මොරාන වරිගේ, උනාපාන වරිගේ, ඌරුවරිගේ, ඇඹලවරිගේ, නාමුඩනවරිගේ සහ තලාවරිගේ යනුවෙන් ආදිවාසීන් වර්ග හයක් සිටින බවත්, එලෙස " වරිගේ " යන්න යෙදීමෙන් වැදිජන කොට්ඨාසයකට අයත් පුද්ගලයකු බව හඳුනාගත හැකි වන බවත් පැමිණිලිකාර පාර්ශවය විසින් කරුණු ඉදිරිපත් කර ඇත.

බන්ධනාගාරයක් වෙත සිරකරුවන් ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් 1877 අංක 16 දරණ බන්ධනාගාර ආඥා පනතේ ප්‍රතිපාදන අදාළ වන අතර එකී ආඥා පනතේ 44(1) වගන්තිය ප්‍රකාරව සිරකරුවෙකු බන්ධනාගාරය වෙත ඇතුළත් කරගැනීමේ දී එම තැනැත්තාගේ නම, වයස, උස, බර, විශේෂ ලක්ෂණ ආදී කරුණු බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ අධිකාරීවරයා විසින් සටහන් කරගත යුතු බව දක්වා ඇත. මේ ආකාරයට සිරකරුවකු බන්ධනාගාරගත කිරීමේදී ඔහු හෝ ඇය පිළිබඳව සවිස්තර වාර්තාවක් තබා ගන්නා බැවින් වින්දිත පාර්ශවය වන තලාවරිගේ පුංචි බණ්ඩා යන අය කුමන ජනවර්ගයකට අයත් ද යන්න අවබෝධ කරගැනීමට වගඋත්තරකාර පාර්ශවය වෙත හැකියාවක් නොතිබූ බවට ප්‍රකාශ කිරීම ගැටලු සහගත බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

මෙහිදී බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කළ යුතුව පවත්නා ලිඛිත නීති රෙගුලාසි අනුව ක්‍රියාකිරීමට බන්ධනාගාරයේ සේවයේ නියතු සියලුම නිලධාරීන් ක්‍රියා කළ යුතු වන අතර එයට පරිබාහිරව කටයුතු කිරීම තුළින් බන්ධනාගාර පද්ධතිය තුළ මනා පැවැත්මට බාධාවන් ඇති විය හැකි බව මෙම සිදුවීම මත නිරීක්ෂණය වේ.

බන්ධනාගාර ව්‍යවස්ථාපිත නීති **160** ප්‍රකාරව ස්ත්‍රී-පුරුෂ දෙපාර්ශවයේම සිවිල් සිරකරුවන්ගේ හෝ වරදකරුවන් බවට පත් සිරකරුවන්ගේ හිස කෙස් නොකැපිය යුතු නමුත්, වෛද්‍ය හේතූන් මත

වෛද්‍ය නිලධාරියාගේ ලිඛිත නිර්දේශය මත අවශ්‍ය සිරකරුවන්ගේ හිසකෙස් කැපිය හැකි බව සඳහන් කර ඇත.

එසේම, බන්ධනාගාර නිත්‍ය නියෝග 495 ප්‍රකාරව වෛද්‍ය අවශ්‍යතා පිට 160 වන ව්‍යවස්ථාපිත නීතියෙහි දැක්වෙන පරිදි වෛද්‍ය නිලධාරියා විසින් ලියවිල්ලෙන් කරන නිර්දේශයකින් විනා ස්ත්‍රී හෝ පුරුෂ වූ කවර පන්තියකට හෝ අයත් වූ කිසිම සිරකරුවෙකුට තම කොන්ඩය කැපීමට බල නොකළ යුතු බව දක්වා ඇත.

ඒ අනුව බන්ධනාගාරය තුළ සිටින සිරකරුවන්ගේ කොණ්ඩය කැපීම පිළිබඳ රෙගුලාසි පවතින බවත්, බන්ධනාගාර නිලධාරීන් විසින් එකී රෙගුලාසි අනුව මෙහිදී කටයුතු කර නොමැති බවත් නිරීක්ෂණය වේ.

1 වන සහ 2 වන වගඋත්තරකරුවන් විසින් සිය ප්‍රකාශයන් තුළින් දක්වා ඇත්තේ වින්දිත පාර්ශවය වන තලාවරිගේ පුංචි බණ්ඩා යන සිරකරුගේ කොණ්ඩය හා රැවුල කැපීම බන්ධනාගාරය තුළ මෙතෙක් පවත්වාගෙන ආ සාමාන්‍ය ක්‍රමවේදයක් අනුව බන්ධනාගාර රැඳවියන්ගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂාව මත සිදුකළ බවයි.

ඒ අනුව බන්ධනාගාරගත කරනු ලබන සිරකරුවන්ගේ කොණ්ඩය හා රැවුල කැපීම එහි පවත්නා සාමාන්‍ය පරිචයක් බව නිරීක්ෂණය වුවද, ඊට අදාළව බන්ධනාගාර නිලධාරීන් විසින් අනුගමනය කළ යුතු නෛතික ප්‍රතිපාදන තිබියදී පරිචයන්ට ප්‍රමුඛතාවය ලබා දීම යුක්ති සහගත කළ නොහැකි බව කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ. එසේම, අනුගමනය කළ යුතු නෛතික ක්‍රියා පටිපාටි නිසිපරිදි අනුගමනය කරනු ලැබුවේ මේ ආකාරයේ ගැටලුකාරී තත්ත්වයන් ඇතිවීම වලක්වා ගත හැකිව තිබූ බවට ද නිරීක්ෂණය වේ.

තවද, එක්සත් ජාතීන්ගේ ආදිවාසීන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය තුළ ද ආදිවාසීන්ගේ චාරිත්‍ර සම්ප්‍රදායන් වලට ඉඩකඩ ලැබිය යුතු බවට සඳහන් වේ. එම ප්‍රකාශනයේ 09, 12, 19, 27 යන වගන්තීන් අනුව හා 34 වගන්තිය අනුව ආදිවාසී ජන කොට්ඨාසවල අයිතිවාසිකම් ආරක්ෂා විය යුතු බව වැඩිදුරටත් සඳහන් කර ඇත.

34 වන වගන්තිය තුළ පහත පරිදි දක්වා ඇත.

"ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූලව ආදිවාසී පුද්ගලයන්ට, පවතින අධිකරණ පද්ධති හෝ සිරිත් විරිත් වලට අදාළව ඔවුන්ගේ ආයතනික ව්‍යුහයන්, ඔවුන්ගේ විශේෂ සිරිත් විරිත්, ආධ්‍යාත්මිකත්වය, සම්ප්‍රදායන්, ක්‍රියා පටිපාටි, පිළිවෙත් ප්‍රවර්ධනය කිරීමට, සංවර්ධනය කිරීමට සහ පවත්වාගෙන යාමට අයිතියක් ඇත"

එම වගන්තිය ප්‍රකාර ආදිවාසී ජනයා හට ස්වකීය සම්ප්‍රදායගත සංස්කෘතික චාරිත්‍ර චාරිත්‍ර අනුව තම දෛනික ජීවිතය වෙනස්කමකට භාජනය නොවී ඉදිරියටත් පවත්වාගෙන යාමට නිදහස පැවතිය යුතුය යන්න අවධාරණය කෙරේ .

එසේවුවද, යම් වරදකට අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු, සිරගත වන සිරකරුවෙකුට යම් සිවිල් අයිතිවාසිකම් භුක්ති විඳීමේ හිමිකම නොලැබෙන බවත්, පොදු සිරගත නීති - පටිපාටි අනුව ක්‍රියා කිරීමට සිදුවන බවත් පෙනී යයි. නිදසුනක් ලෙස සිරගත වූ බෞද්ධ භික්ෂුවකට සිරගත වූ පසුව සිවුර දරා සිටීමේ හිමිකම නොලැබේ.

<u>නිගමනය</u>

ඉහත දක්වන ලද සියලු කරුණු සමස්තයක් ලෙස ගෙන සලකා බැලීමේදී බන්ධනාගාර ව්‍යවස්ථාපිත නීති 160 සහ බන්ධනාගාර නිත්‍ය නියෝග 495 අනුව බන්ධනාගාරගතව සිටින යම් සිරකරුවෙකුගේ කොණ්ඩය සහ රැවුල කැපීම සඳහා වෛද්‍ය නිලධාරියෙකු විසින් ලිඛිත ලියවිල්ලකින් කරන ලද නිර්දේශයක් තිබීම අත්‍යවශ්‍ය වන බව පැහැදිලි වේ. එහෙත් මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන තලාවරිගේ පුංචි බණ්ඩා යන සිරකරුගේ කොණ්ඩය සහ රැවුල කැපීම සඳහා වෛද්‍ය නිලධාරියා විසින් ලිඛිත ලියවිල්ලකින් නිර්දේශයක් ලබා දී නොමැති බව අනාවරණය වී ඇත. ඒ අනුව බන්ධනාගාර නිලධාරීන් විසින් බන්ධනාගාර ව්‍යවස්ථාපිත නීති 160 සහ බන්ධනාගාර නිත්‍ය නියෝග 495 නොසලකා කටයුතු කර ඇති බව මෙහිදී නිරීක්ෂණය වන බැවින් 1 වන සහ 2 වන වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති නීතිය පසිදලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුතුය යන වින්දිත පාර්ශවයේ මූලික අයිතිවාසිකම උල්ලංඝණය කර ඇති බව නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශ කර සිටී.**

1. වගඋත්තරකාර පාර්ශවය විසින් වින්දිත පාර්ශවයේ කොණ්ඩය සහ රැවුල කැපීම සම්බන්ධයෙන් ඔහුගෙන් ලිඛිතව සමාව ලබා ගත යුතු ය.

2. බන්ධනාගාරගතව සිටින කිසියම් සිරකරුවෙකුගේ කොණ්ඩය හා රැවුල කැපීමේදී පවතින නෛතික ප්‍රතිපාදනයන්ට අනුගත වෙමින් වෛද්‍ය නිලධාරියෙකු විසින් ලබාදෙනු ලබන ලිඛිත නිර්දේශයක් මත පමණක් එය සිදු කිරීමට 1 වන සහ 2වන වගඋත්තරකරුවන් වගබලා ගත යුතු ය.

3. බන්ධනාගාර තුළ පවතින වාතාවරණය හමුවේ යම් සිරකරුවෙකුගේ කොණ්ඩය හා රැවුල කැපීම අත්‍යවශ්‍ය වන්නේ නම් ඊට පූර්වයෙන් අදාළ සිරකරුවාගෙන් ඒ සඳහා ලිඛිත කැමැත්ත ලබා ගැනීමට 1 වන සහ 2 වන වගඋත්තරකරුවන් කටයුතු කළ යුතු ය.

4. විශේෂ ජන කොට්ඨාසයකට (එනම්, ආදිවාසී ජන කොට්ඨාසය වැනි) අයත් පුද්ගලයකු කිසියම් වරදකට වරදකරු වී සිරගත කරනු ලැබූ විට එම පුද්ගලයා අයත් වන ජන කොට්ඨාසයට ආවේණික ලක්ෂණයන් පිළිබඳව අවධානය යොමු කරමින් කටයුතු කරන ලෙසට 1 වන සහ 2 වන වගඋත්තරකරුවන් වගබලා ගත යුතු ය.

5. බන්ධනාගාර අණ පනත් හා සම්බන්ධ ප්‍රයෝගික භාවිතය පිළිබඳව කලින් කල දැනුවත් කිරීම් සිදු කරමින් බන්ධනාගාර නිලධාරීන්ගේ දැනුම යාවත්කාලින කිරීමට බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් කටයුතු කළ යුතු ය.

2024. 09 . 20 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්

පිටපත :- 01. අමාත්‍යතුමා,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ
අමාත්‍යාංශය,
නො.19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10

02. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා
බන්ධනාගාර දෙපාර්තමේන්තුව,
නො.150, බේස්ලයින් පාර,
කොළඹ 09.